ඒෂියන් ග්‍රැමර් පාසල

පළමු වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව

කාලය පැය 3 යි.

නම : .......................................................... පන්තිය : ...............................

සැකසුම : රුක්මන් අබේසිංහ

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

කාලය පැය 01යි.

- පහත සඳහන් නාට්‍ය ගීත ඇසුරෙන් 1 - 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. ප්‍රේමයෙන් මන රංජිත වේ - නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ - ලංකෘත වේ
ආලයෙන් වෙළි සැදි මෙ ලතා
මණ්ඩපයෙන් චණ්ඩාතප ඛණ්ඩිත වේ හිරු රජිඳුගෙ

B. ඇහැල මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි
අඹ රඹුටන් ජම්බු ඉදිල
අද හැම තැන හරි හැඩයි

C. විභාගේ විභාගේ
එහෙ බැලුවත් විභාගේ - මෙහෙ බැලුවත් විභාගේ
විභාගේ තමයි අපේ අභාගේ //

D. මෙන්න මෙහෙ වරෙව් කොල්ලනෙ
නට නටා වරෙව්
යකෝ ..... තොපිට හරිම වාසියක්
නට නටා වරෙව්
යකෝ ..... තොපිට හරිම ......//

E. සවන් දී පෙර රාම චරිතේ අසව්
පොරණ ලක්දිව උන්න රාවණ
ආල වී ජානකී ගෙන ගියේ තම රියේ
කියම් එය සංගීත බසිනා - පෙර රාම චරිතේ අසව්

01. බන්දුල ජයවර්ධනගේ බෙරහඬ නාට්‍යයේ ගීතය අයත්වන අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D

02. නූර්ති නාට්‍යයක ගීතයක් අයත්වන අක්ෂරය වන්නේ,

(1) B (2) C (3) D (4) E

03. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යකට අයත් ගීතයට අදාල අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) E

04. 'ගම දූව' නමැති චරිතය විසින් ගායනය කරනු ලබන ගීතය අයත් අක්ෂරය වන්නේ,

(1) A (2) B (3) C (4) D

05. යොවුන් නාට්‍ය සංකල්පයට අදාල නාට්‍ය ගීතය වන්නේ,

(1) A (2) B (3) C (4) E

- **ප්‍රශ්න අංක 6 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

06. පහත සඳහන් නාට්‍ය අතරින් ළමා නාට්‍යයක් නොවන්නේ,

(1) සෙල්ලං ලෙල්ලං (2) අමර ගියා දිවිය ලෝකේ
(3) බෙරහඬ (4) තොප්පි වෙළෙන්දා

07. ප්‍රාසාංගික කලාවක් ලෙස නොසැලකෙන්නේ,

(1) නාට්‍ය කලාව (2) නර්තන කලාව
(3) චිත්‍රපට කලාව (4) සංගීත කලාව

08. නාට්‍ය කලාවේ සිටින්නේ නළුවා නම්, ප්‍රාසාංගික කලාවේ දී .......

(1) ගුරුන්නාන්සේ (2) අභිවාහකයා
(3) ආතුරයා (4) නර්තන ශිල්පියා

09. නාට්‍ය අධ්‍යක්ෂවරයාගේ කාර්යභාරයක් නොවන්නේ,

(1) නාට්‍ය පුහුණුවීමේ කටයුතු කිරීම
(2) අනුශාංගික ශිල්පීන් සමඟ සාකච්ඡා කිරීම.
(3) නාට්‍යයේ ප්‍රධාන චරිතය තමා විසින් නිරූපණය කිරීම
(4) නාට්‍ය පිටපතේ යටිපෙළ තේරුම් ගැනීම.

10. රූපණය යනු

(1) කිසියම් චරිතයක් අනුකරණය කිරීම.
(2) චරිතයකට බාහිර වශයෙන් සමාරෝපය වීම.
(3) චරිතයට අදාල සංවාද නිවැරදිව භාවිතා කිරීම.
(4) චරිතයේ බාහිර සහ අභ්‍යන්තර ලක්ෂණ තේරුම් ගනිමින් චරිතය තුළ ජීවත්වීම.

11. "රංග අභ්‍යාස" තුළින් නළුවකු බලාපොරොත්තු නොවන්නේ,

(1) ශාරීරික සහ මානසික ශිථිල භාවය (2) නම්‍යශීලී ශරීරයක් ගොඩනගා ගැනීම.
(3) පියකරු පෙනුමක් ලබා ගැනීම. (4) සාර්ථක ලෙස සතර අභිනය භාවිතා කිරීම.

12. "ජන කරළිය" රංග භූමිය ලංකාවට හඳුන්වා දෙන ලද්දේ,

(1) සුගතපාල ද සිල්වා සමඟ සුනන්ද මහේන්ද්‍ර
(2) පරාක්‍රම නිරිඇල්ල සමඟ එච්.ඒ. පෙරේරා
(3) චන්ද්‍රසේන දසනායක සමඟ සෝමලතා සුබසිංහ
(4) ගාමිණී හත්තොටුවේගම සමඟ ධම්ම ජාගොඩ

13. හෙන්රි ජයසේන විසින් පරිවර්තනය කළ "හුණුවටයේ කතාව" නාට්‍යයේ මුල් නිර්මාණකරු වන්නේ,
(1) විලියම් ශේක්ෂ්පියර් (2) ඇන්ටන් චෙකෝෆ්
(3) ආතර් මිලර් (4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්

14. දයානන්ද ගුණවර්ධනයන්ගේ "නරිබෑනා" නාට්‍ය නිර්මාණය වී ඇත්තේ,
(1) ජාතක කතාවකිනි. (2) ජනකතා දෙකක එකතුවෙනි.
(3) ජනකතාවකිනි. (4) සුරංගනා කතාවකිනි.

15. අනුශාංගික ශිල්පියෙකු නොවන්නේ,
(1) වේෂ භූෂණ නිර්මාණකරු (2) පසුතල නිර්මාණකරු
(3) අංග රචනා ශිල්පියා (4) නාට්‍ය පෙළ රචකයා

16. ප්‍රේම කුමාර එපිටවෙලගේ "තිත්ත බත"
(1) මුද්‍රා නාට්‍යයකි. (2) ළමා නාට්‍යයකි. (3) පාසල් නාට්‍යයකි. (4) වීදි නාට්‍යයකි.

17. ලංකාවේ සම්මානනීය අංග රචනා ශිල්පියෙකු වන්නේ,
(1) ජගත් චමිල (2) ජගත් පද්මසිරි (3) ජැක්සන් ඇන්තනී (4) ප්‍රියන්ත ශ්‍රීමාල්

18. ඔපෙරාවක ප්‍රධාන මාධ්‍ය වන්නේ,
(1) නර්තනය (2) ගායනය (3) ආහාර්ය අභිනය (4) අනුරූපණය

19. නාට්‍ය පෙළක අඩංගු "රංග විධාන" අදාල නොවන්නේ,
(1) ප්‍රේක්ෂකයාට (2) නළුවාට
(3) අධ්‍යක්ෂවරයාට (4) සංගීත අධ්‍යක්ෂවරයාට

20. ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියා වන්නේ,
(1) ලූෂන් බුලත්සිංහල (2) ගාමිණී හත්තොටුවේගම
(3) එච්.ඒ. පෙරේරා (4) සුගතපාල ද සිල්වා

21. හෙන්රි ජයසේන ගේ "කුවේණි" නාට්‍යයේ හොඳම නිළිය සම්මානය දිනාගත්තේ,
(1) මානෙල් ජාගොඩ (2) මානෙල් ජයසේන
(3) රම්‍යා වනිගසේකර (4) අනුලා බුලත්සිංහල

22. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍ය නොවන්නේ,
(1) මහාසාර (2) මනමේ (3) රත්තරං (4) කපුවා කපෝති

23. ජෝන් ද සිල්වාගේ නූර්තියක් නොවන්නේ,
(1) රාමායනය (2) කඩවුණු පොරොන්දුව
(3) සිරිසඟබෝ (4) නල රාජ

24. ශ්‍රී ලංකාවේ ජන නාටක ත්‍රිත්වය වන්නේ,
(1) සොකරි, කෝලම්, නූර්ති (2) සොකරි, කෝලම්, ජයමාන්න නාට්‍ය
(3) සොකරි, කෝලම්, නාඩගම් (4) කෝලම්, නාඩගම්, නූර්ති

25. කොකේසියන් චෝක් සර්කල්, චෙරිවත්ත, ඇන්ටිගනී, රත්නාවලී යන නාට්‍යවල මුල් නිර්මාණකරු වන්ගේ නම් අනුපිළිවෙල වන්නේ,
   (1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්, ඇන්ටන් චෙකොෆ්, ශ්‍රී හර්ෂ, සොපොක්ලීස්
   (2) ශ්‍රී හර්ෂ, ඇන්ටන් චෙකොෆ්, සොෆොක් ලීස්, බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
   (3) ඇන්ටන් චෙකොෆ්, සොෆොක් ලීස්, ශ්‍රී හර්ෂ, බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
   (4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්, ඇන්ටන් චෙකොෆ්, සොෆොක් ලීස්, ශ්‍රී හර්ෂ

■ **පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 26 - 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A | උෟරා යක්කම | E | නාගසේන ස්ථවිර |
| B | වඩිග පටුන | F | ගඳහ යක්ෂයා |
| C | දොරකඩ අස්න | G | පහන් මඩුව |
| D | ගබඩා කොල්ලය | H | කපුයක්කාරිය |

26. උඩරට ප්‍රදේශයේ පවත්වන ශාන්තිකර්මයකට අයත් අංග දෙකක් හඳුන්වන අක්ෂර වන්නේ,
   (1) A සහ B (2) A සහ H (3) A සහ D (4) C සහ B

27. බෞද්ධ වත්පිළිවෙත්වලට අයත් අංග සහ චරිත ඇතුළත් අක්ෂර වන්නේ,
   (1) A, C සහ G (2) C, E සහ F (3) D, A සහ G (4) C, E සහ D

28. සබරගමුව පළාත නියෝජනය කරන ශාන්ති කර්මය දක්වන අක්ෂරය වන්නේ,
   (1) G (2) C (3) B (4) H

29. සූනියම් යාගයේ නාට්‍යමය ලක්ෂණවලින් පිරි අංගය හඳුන්වන අක්ෂරය වන්නේ,
   (1) A (2) B (3) C (4) D

30. පහතරට බෙරය හෙවත් දෙවොල් බෙරය භාවිතා කරනු ලබන අංග ද්විත්වය හඳුන්වන අක්ෂර වන්නේ,
   (1) A සහ B (2) A සහ C (3) E සහ F (4) B සහ H

■ **පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 31 - 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| නාට්‍යයේ නම | මුල් කෘතියේ රචක | අනුවර්තනයේ හෝ පරිවර්තනයේ නම | පරිවර්තකයා හෝ අනුවර්තකයා |
|---|---|---|---|
| ද ප්‍රොපෝසල් | a | මඟුල් ප්‍රස්ථාව | b |
| c | d | බෙරහඬ | e |

31. වගුවේ " **a** " කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?
   (1) ඇන්ටන් චෙකොෆ් (2) නිකොලොයි ගොගොල්
   (3) ටෙනසි විලියම්ස් (4) ෂෝන් පෝල් සාත්‍රෙ

32. වගුවේ " **b** " කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,
   (1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) යූ.ඒ. ගුණසේකර
   (3) ඒ.පී. ගුණරත්න (4) බන්ධුල විතානගේ

33. වගුවේ " c " කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,

(1) එව්රිමෑන් (2) ඉක්නෙව්ටාඉ
(3) ද ග්ලාස් මෙනාජරි (4) ඩෝල්ස් හවුස්

34. වගුවේ " d " කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,


(1) ඊස්කිලස් (2) ටෙනසි විලියම්ස්
(3) සොපොක්ලීස් (4) යුරිපිඩීස්

35. වගුවේ " e " කොටුවේ සඳහන් විය යුතු නම වන්නේ,


(1) බන්දුල ජයවර්ධන (2) හෙන්රි ජයසේන
(3) රංජිත් ධර්මකීර්ති (4) සුගතපාල ද සිල්වා


■ පහත රූප ඇසුරින් 36 - 40 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.


A


B


C


D


E

36. A රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ,

(1) චාල්ස් ඩයස් (2) ජෝන් ද සිල්වා
(3) සී. දොන් බස්තියන් (4) බී.ඩබ්.ජී. ජයමාන්න

37. B කොටුවේ යොදා ඇති අංග රචනය අයත් වන්නේ,

(1) විකාරරූපී අංග රචනයකි (2) ශෛලිගත අංග රචනයකි
(3) ඍජු අංග රචනයකි (4) මායාකාරී අංග රචනයකි

38. C කොටුවේ දැක්වෙන ශිල්පියා වන්නේ,

(1) මාර්ෂල් මාෂොව් (2) ජයන්තා රණවක
(3) විමල් කුමාර ද කොස්තා (4) සාලමන් ෆොන්සේකා

39. D කොටුවේ දැක්වෙන තාල් භාණ්ඩය හඳුන්වන්නේ,

(1) යක් බෙරය නමිනි. (2) ගැටබෙරය නමිනි.
(3) මද්දලය නමිනි. (4) ඩෝලය නමිනි.

40. E කොටුවේ දැක්වෙන නාට්‍ය අධ්‍යක්ෂවරයා වන්නේ,

(1) සුගතපාල ද සිල්වා (2) සුනන්ද මහේන්ද්‍ර
(3) ආර්.ආර්. සමරකෝන් (4) හෙන්රි ජයසේන

# ඒෂියන් ග්‍රැමර් පාසල

## 10 ශ්‍රේණිය

## පළමුවන වාර පරීක්ෂණය - 2018

## නාට්‍ය හා රංග කලාව

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

කාලය පැය 02 යි.

---

01. විකෘති නාට්‍ය පෙළ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(I) මෙම නාට්‍ය මෙම වසර වන විට නිෂ්පාදනය කර වසර කීයක් ගත වී තිබේ ද? (ලකුණු 2)

(II) මෙම නාට්‍ය කුමන වයස් කාණ්ඩයක් සඳහා ද? (ලකුණු 2)

(III) මෙම නාට්‍ය දර්ශන කීයකට බෙදා තිබේ ද? (ලකුණු 2)

(IV) මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතයේ නම කුමක්ද? (ලකුණු 2)

(V) ප්‍රධාන චරිතය උමතුවීමට බලපෑ හේතු මොනවාද? (ලකුණු 2)

(VI) ප්‍රධාන චරිතයේ පියා වන කරුණාරත්නගේ චරිත ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 2)

02. (I) 'අභිනය' යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 2)

(II) සතර අභිනය විස්තර කරන්න. (ලකුණු 4)

(III) අභිනය අතරින් වාචික අභිනය නාට්‍යයක වඩාත් වැදගත් වන්නේ කවර හෙයින් ද? (ලකුණු 6)

03. (I) රංග අභ්‍යාස යනු කුමක්ද? (ලකුණු 2)

(II) රංග අභ්‍යාස වර්ග මොනවාද? (ලකුණු 4)

(III) ඔබ දන්නා එක් රංග අභ්‍යාසයක් අනුපිළිවෙලට විස්තර කරන්න. (ලකුණු 6)

04. (I) ශ්‍රී ලංකාවේ ගැමි නාට්‍ය වර්ග මොනවාද? (ලකුණු 2)

(II) උඩරට පළාතට අයත් ගැමි නාටකයෙහි චරිත මොනවාද? (ලකුණු 4)

(III) ඉහත නාට්‍ය වර්ගයේ රංග ශෛලියේ විශේෂ ලක්ෂණ 05 ක් ලියන්න. (ලකුණු 6)

05. (I) රංගාලෝකකරණයේදී භාවිතා කරනු ලබන පහන් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(II) ලෝක ධර්මී සහ නාට්‍ය ධර්මී නාට්‍ය ශෛලීන් දෙකෙහි ආලෝකකරණය යොදා ගන්නා ආකාරය වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 4)

(III) පහත සඳහන් අවස්ථාවන් සඳහා යෙදිය යුතු ආලෝක වර්ණ තීරණය කරන්න.

- මිනී මැරුමක් සිදුවන අවස්ථාවක දී කුමන වර්ණය භාවිත කළ යුතුද?
- රාජකීය බව, උදාර බව සංකේතවත් කිරීම සඳහා කුමන වර්ණය යෙදිය යුතුද?
- ගහකොළ වලින් පිරී ගිය පරිසරය සංකේතවත් කිරීමට යෙදිය යුතු වර්ණය කුමක්ද?
- සාගතය, දරිද්‍රතාවය, ශෝකය සංකේතවත් කිරීම සඳහා යෙදිය යුතු වර්ණය කුමක්ද?
- පාළු ගතිය, දුක, මලානික බව සංකේතවත් කිරීම සඳහා යෙදිය යුතු වර්ණය කුමක්ද? (ලකුණු 6)

06. (I) වේදිකා භූගෝලය කොටස් 09 කට බෙදා ඇති ආකාරය රූප සටහනක් මගින් විස්තර කරන්න.

(ලකුණු 2)

(II) වේදිකා භූගෝලීය බෙදීම වඩාත් වැදගත් වන්නේ කවර ශිල්පීන්ට ද? (ලකුණු 4)

(III) රංග භූමියක දෘශ්‍ය රේඛාව පිහිටන ආකාරය රූප සටහනකින් ඇඳ පෙන්වන්න. (ලකුණු 6)

07.



(I) ඉහත රූපයේ සිටින නාට්‍යකරුවාගේ නම සඳහන් කර ඔහුගේ නිර්මාණ 05 ක් ලියන්න.

(ලකුණු 2)

(II) ඉන් එක් නාට්‍යයක කතා තේමාව කෙටියෙන් ලියන්න. (ලකුණු 4)

(III) මෙම නාට්‍ය කරුවාගෙන් දේශීය නාට්‍ය කලාවට සිදු වූ සේවාව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 6)